*සැ. යු.* - 2011.08.05 වැනි දින පළවූ අංක 1,718 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,719 - 2011 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2011.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | -- | රජයේ නිවේදන ... ... ... | 542 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 542 | මිල පාලන දැන්වීම් ... ... ... | -- |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | -- | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | -- |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | -- |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | -- |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | -- | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 545 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | -- | නැවියන්ට දැන්වීම් ... ... ... | -- |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | -- |

*සැ. යු.*- කාසිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011, ජුලි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2011 අංක 000

DVF/RECT/278/44/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම

**අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2009 නොවැම්බර් මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිතන් ගම්ලත් ලියනගේ රංජිත් ඉඳුනිල් ශ්‍රීලංජාආබමු (නි/6086)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

08-344

2011 අංක 000

DVF/RECT/1278/49/AY

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම

**අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2009 දෙසැම්බර් මස 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් මාරසිංහ මුදියන්සේලාගේ අජිත් රණසිංහ ශ්‍රීලංඉ (නි/5851)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

08-345

# රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40.

**(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**
18 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් 2007 පෙබරවාරි මස 23 වැනි දින අංක 1486 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත කී ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයෙහි "ආරක්ෂිත ස්මාරක" යනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද 32 වැනි අයිතමය ස්මාරක ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2011 ජුනි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-356/2

එල්. ඩී. බී. 277/40.

**(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**
18 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය ජගත් බාලසූරිය වන මා විසින් 2005 ජූලි මස 08 වැනි දින අංක 1401 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත කී ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයෙහි "ආරක්ෂිත ස්මාරක" යනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද ස්මාරක ලැයිස්තුවෙන් 174 වැනි අයිතමය ඉවත් කරනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2011 ජුනි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-356/1

අංකය ප්‍ර. නො. 11/2 /16 /120/ පිටු /සැ

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 වැනි අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 වැනි අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.08.15 වැනි දින සිට 2011.08.29 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2011.09.05 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "Con A" දරන කොට්ඨාසයේ 121 වෙළුමේ 113-114 පත්ඉරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුල ඩික්මන් පාරේ පිහිටි වරිපනම් අංක 14 - 4/1 දරන වර්ග අඩි 1069 ක බිම් ප්‍රමාණයකින් යුත් සී. සීමරත්නම් මානක තැනගේ 2000.04.07 දින අංක 352 දරන සභාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති ඩී 1 දරන ඒකකයට එකී පිඹුරේ ප්‍රකාර මායිම් : උතුරට : සී ඊ 3 සහ සී ඊ 6 හි විවෘත ඉඩකඩ සහ ඒකක ඩී 2, සීඊ 4 (එස්ඩබ්) සීඊ 29 සහ මෙම ඒකකය අතර බිත්තියේ මැද. නැගෙනහිරට : සීඊ 16 හි විවෘත ඉඩකඩ සහ පුද්ගලික පාර සමග මෙම ඒකකයේ බිත්තිය දකුණට : සීඊ 16 හි විවෘත ඉඩකඩ සහ මෙම ඒකකය අතර බිත්තියේ මාධ්‍ය. බස්නාහිරට : සීඊ 18 හි විවෘත ඉඩකඩ සහ ඩික්මන්ස් පාරේ වරි. අංක 12 දරන මෙම ඒකකයෙහි බිත්තිය මුදුන : ඒකක ඊ 1 මතින් වූ කොන්ක්‍රීට් බිමේ මාධ්‍ය. පතුල : ඒකක සී 1 මගින් වූ මෙම ඒකකයේ කොන්ක්‍රීට් බිමේ මාධ්‍යය | 1. ජී. ආර්. එම්. බණ්ඩාර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 2004.01.23 දින අංක 1374 දරන උකස් අවලංගු කිරීමේ ඔප්පුව<br>2. ජී. ආර්. එම්. බණ්ඩාර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 2004.01.23 දින අංක 1523 දරන විකුණුම්කර ඔප්පුව<br>3. කේ. කුලසිංහම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 2004.04.08 දින අංක 1381 දරන විකුණුම්කර ඔප්පුව<br>4. කේ. කුලසිංහම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 2004.04.08 දින අංක 1382 දරන ගිවිසුම් ඔප්පුව.<br>5. කේ කුලසිංහම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 2004.06.07 දින අංක 1431 දරන ප්‍රකාශන ඔප්පුව |

08-271

---

අංකය : ප්‍ර. නො. 11/2/8/2011 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 වැනි අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 වැනි අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.08.15 වැනි දින සිට 2011.08.29 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2011.09.05 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "A" දරන කොට්ඨාසයේ 423 වෙළුමේ 296 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ බම්බලපිටියේ පොලිස් පාර්ක් පෙදෙසේ 87 වැනි පටුමග පිහිටි වරි. අංක 4 දරන කොලිංග්නෝර් නැමැති ඉඩමේ මැන බෙදා වෙන් කරන ලද අ. 0, රූ. 0, පර්. 30 විශාලත්වයෙන් යුතු කැබලි අංක ඒ 3 දරන කොටසට සී. සී. විජේතුංග මානක තැනගේ 1930.11.17 දින අංක 2221ඒ දරන පිඹුරේ ප්‍රකාර මායිම් :<br>*උතුරට :* ලොට් ඒ 3 ;<br>*නැගෙනහිරට :* රෝමානු කතෝලික පල්ලියට අයත් දේපල<br>*දකුණට :* ලොට් බී ;<br>*බස්නාහිරට :* පොලිස් පාර්ක් සඳහා වූ බිම් තීරය | 1. ඒ ආර්. ආරියරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 1963.03.05 වැනි දින අංක 1100 දරන තෑගි ඔප්පුව.<br>2. පී. එෆ්. එම්. විජේසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ 1987.12.01 දින අංක 316 දරන තෑගි ඔප්පුව. |

08-273

---

අංකය : ප්‍ර. නො. 11/2/17/2011 පිටු/සැ

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 වැනි අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 වැනි අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.08.15 වැනි දින සිට 2011.08.29 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2011.09.05 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
ප්‍ර.නො.11/2/17/2011/පිටු/සැ.

උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "M" දරන කොට්ඨාසයේ 658 වෙළුමේ 250 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පාගොඩ යන ගම පිහිටි දෙල් ගහ කුරුඳුවත්ත නැමැති ඉඩමේ මැන බෙදා වෙන් කරන ලද අ. 0, රූ. 0, පර්. 6 3/4 විශාලත්වයෙන් යුතු කැබලි අංක සී දරන කොටසට සී. ආර්. හාඩිංග් මානක තැනගේ 1945.01.07 වැනි දින අංක 349 දරන පිඹුරේ ප්‍රකාර මායිම් :<br>*උතුරට :* මෙම ඉඩමේ ලොට් බී දරන කොටස ;<br>*නැගෙනහිරට :* මෙම ඉඩමේ ලොට් ඩී දරන කොටස<br>*දකුණට :* ලොට් එෆ් දරන පාරක් සඳහා වෙන් කළ බිම් තීරය ;<br>*බස්නාහිරට :* මෙම ඉඩමේ බී දරන කොට්ඨාස | 1. ජේ. ඒ. සෙනවිරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කල 1959.07.12 වැනි දින අංක 31 දරන විකුණුම්කරය.<br>2. ඩී. එස්. ජයවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.02.02 වැනි දින අංක 479 දරන විකුණුම්කරය. |

08-272

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - කැකිරාව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0770-08703300-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.09.29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සී. මායාදුන්නේ විසින් සහතික කරන ලද 1998 ජනවාරි මස 1 දිනැති අංක 432, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. කේ. කේ. වීරකෝන් විසින් දෙකම සහතික කරන ලද 1998 මැයි මස 14 දිනැති අංක 14 සහ 1999 මාර්තු මස 16 දිනැති අංක 72 සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ඩබ්ලිව්. චාමරසිංහ විසින් සහතික කරන ලද 2004 අප්‍රේල් මස 21 දිනැති අංක 484 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පොතාන, ඉපලෝගම පදිංචි රන්බණ්ඩාගේ ප්‍රියන්ත රාජකරුණා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්ලක්ෂ විසිඅටදහස් හත්සිය හැට හතයි ශත තිහක (රු.5,28,767.30) මුදලක්, 2010 මාර්තු මස 10 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 5,28,767.30 මුදලද, 2010 මාර්තු මස 11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර ගැනීම පිණිස ඉහත කී අංක 432, 14, 72 සහ 484 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාගම් පළාත, කලාගම් කෝරළේ, උතුර ඉහළ කලාගම් තුලන කොනපතිරාව පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කේ. සිල්වා විසින් සාදන ලද 1991 අගෝස්තු මස 2 නැති අංක 333 දරන සැලැස්මේ සඳහන් අක්කර තුනයි පර්චස් දොළහක් (අ. 3, රූඩ් 0, පර්. 12) විශාල උතුරට : පාර සඳහා වෙන් කිරීම ද, නැගෙනහිරට : ටී. ජී. 219575 හි සඳහන් ඉඩම ද, දකුණට : රජයේ ඉඩම සහ බස්නාහිරට : පීපී 198 දරන සැළැස්මේ සඳහන් ලොට්ස් 55කියු 550 සහ 55 එන් ද, මායිම් වන ගලපිටියේ කැලේ නමැති ඉඩමේ කොටසක් වන ලොට් අංක 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට

මායිම්, උතුරට : පාර (අනුරාධපුර සිට කැකිරාවට) ද, නැගෙනහිරට : එකී සැළැස්මේ සඳහන් ලොට් 3 සහ 4 ද, දකුණට : එච්. එම්. පුංචි බණ්ඩාගේ කුඹුර සහ බස්නාහිරට : එකී සැළැස්මේ සඳහන් ලොට් 1 ද යන මායිම් තුළ රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 2, පර්. 28.01) විශාල එහි පිහිටි සියලු දේ සමග මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව බී 166/185 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

08-387

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ද කැන්ඩි ටයර් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0029 3000 3215.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2011 මාර්තු මස 30 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එස්. වී. ඊ. විජේරත්න යන අය විසින් ලියා සහිතක කරන ලද 1994 මාර්තු මස 31 දාතම හා අංක 819, ඩී. පී. එල්. එච්. එච්. සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2004 මැයි මස 25 දාතම හා අංක 2860, ජී. පී. අයි. උදයංගනී යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ඔක්තෝම්බර් 30 දාතම හා අංක 204, ඒ. එම්. කේ. ඒ. ගුණතිලක යන අය විසින් ලියා සහතික කරන ලද 1995 දෙසැම්බර් 21 දාතම හා අංක. 1252, ඩී. පී. එල්. එච්. එච්. සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2004 මැයි 25 දාතම හා අංක 2863 හා ජී. පී. අයි. උදයංගනී යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ඔක්තෝබර් මස 30 දාතම හා අංක 202 දරන උකස් බැඳුම්කර මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහනුවර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කාර්යාලය සහිතව එකී ජනරජයේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් මත "ද කැන්ඩි ටයර් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්" බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 819, 286, 204, 1252, 2863 සහ 202 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හත් කෝටි අනූ නම ලක්ෂ දස දහසක (රු. 79,910,000) මුදලද, 2011 ජනවාරි 10 වැනි දින ට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් හත් කෝටි අනූ නව ලක්ෂ දස දහසක (රු. 79,910,000 මුදලද, 2010 ජනවාරි මස 11 වැනි දින සිට අංක 819, 2860, 204, 1252, 2863, සහ 202 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් කෝටි පනස් ලක්ෂයක (රු.75,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට (අවම 16%) සියයට දෙකයි දශම පහක් (2.5%) +Average Weighted Prime Lending Rate බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 819, 2860, 204, 1252, 2863 සහ 202 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ මහනුවර පිහිටි කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 106 ඒ දරන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. කේ. එම්. එම්. වැලිවිට යන අය විසින් සාදන ලද 1982 ඔක්තෝබර් මස 02 දාතම හා අංක 1904 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2, නැගෙනහිරට : ලොට් 2, දකුණට : කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 104 දරන පරිශ්‍රයන් වෙන්කරන කාණුව සහ බස්නාහිරට : කොටුගොඩැල්ල වීදිය වෙන් කරන පදික වේදිකාව යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම පහයි හයයි දෙකක් (අක්. 0, රූ. 0, පර්. 1.562) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1904 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව 333/218 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී මහනුවර පිහිටි කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 106 දරණ, අංක 1904 දරණ එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට අති ඉඩම් කොටසට මායිම්, උතුරට : කොටුගොඩැල්ල වීදිය වරිපනම් අංක 108 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : තාප්පය, දකුණට : කොටුගොඩැල්ල වීදිය පරිපනම් අංක 107 දරන පරශ්‍රයන් සහ බස්නාහිරට : කොටුගොඩැල්ල වීදිය වෙන් කරන පදික වේදිකාව යන මායිම් කුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1904 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව 400/01 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 819, 2860 සහ 204 ප්‍රකාර හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ බොරැල්ල උතුර මරදාන වෝඩ් අංක 33 පිහිටි ඥානාර්ථ ප්‍රදීප මාවත වරිපනම් අංක 29 (කලින් වරිපනම් අංක 1089) දරන ඉඩමට බලයලත් මානක තැන වී. සිත්සබේසන් යන අය විසින් සාදන ලද 1990 සැප්තැම්බර් මස 13 දාතම හා අංක 1099 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් X1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : වරිපනම් අංක 1 දරන පරිශ්‍රයන් සහ පාර්ක් ඇවනිව්, ගිණිකොණට : පාර්ක් ඇවනිව්, නිරිතට : ඥාණාර්ථ ප්‍රදීප මාවත සහ වයඹට : ලොට් X1A1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හයයි දෙකක්

(අක්. 0, රූ. 0, පර්. 11.62) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1099 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 1042/163 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැඳුම්කර අංක 1252, 2863 සහ 202 ප්‍රකාර හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-371

---

පීවී 17291.

2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "එස්.ජී. ලංකා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2005.06.16" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "එස්. ජී. ලංකා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "එස්. ජී. ලංකා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-228

---

පීවී 12968.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "කමල් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "1986.05.13" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "කමල් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිතර නොවන බව නැතහොත් ක්‍රියාවිරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "කමල් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජූලි මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-229

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.